# ශ්‍රී ලංකා සමාජ ආරක්ෂණ මණ්ඩලය

**(ප්‍රාථමික කර්මාන්ත සහ සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශය)**

SSB

## ශ්‍රී ලංකා සමාජ ආරක්ෂණ මණ්ඩලයේ පුරප්පාඩුව පවතින පහත සඳහන් ස්ථිර තනතුරු සඳහා මූලික සුදුසුකම් සපුරා ඇති පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

### සමාජ ආරක්ෂණ නිලධාරී (විශ්‍රාම වැටුප්) - 01

**සුදුසුකම් :**

01. ගිණුම්කරණය / අලෙවිකරණය / රාජ්‍ය පරිපාලනය / වාණිජවේදී / ආර්ථික විද්‍යාව පිළිබඳ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් උපාධියක් ලබා තිබීම

හෝ

02. තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයට ගැළපෙන්නා වූ පිළිගත් වරලත් වෘත්තීය ආයතනයක අන්තර් මධ්‍යම පරීක්ෂණය සමත් වීම.

**අභ්‍යන්තර අයදුම්කරුවන්**

01. ඉහත සඳහන් බාහිර අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම් සපුරා තිබීම.
02. කළමනාකරණ සහකාර - තාක්ෂණික නොවන (MA 1) සේවා ශ්‍රේණියේ II ශ්‍රේණියේ තනතුරක සමාජ ආරක්ෂණය සම්බන්ධ වසර 05 ක සතුටුදායක සේවා කාලයක් තිබීම.

**වයස් සීමාව :**

අවුරුදු 22 ට නොඅඩු හා අවුරුදු 45 ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන්ට උපරිම වයස් සීමාව අදාළ නොවේ.

**වැටුප් ක්‍රමය :**

2016.04.25 දිනැති 02/2016 කළමනාකරණ සේවා චක්‍ර ලේඛය අනුව 2020 සිට ඔබේ තනතුරට හිමි වැටුප් ප්‍රමාණය JM 1-1 (2016) - රු. 42,600 - 10X775 - 18X1135 - 70,580 ක් වේ.

බඳවා ගැනීමේ දී වැටුප් තලය රු. 38,185.00 වේ.

**වෙනත් දීමනා :** රජය මගින් අනුමත දීමනා හිමි වේ.

### දත්ත පරිපාලක - 01

**සුදුසුකම් :**

තොරතුරු තාක්ෂණය විෂය ක්ෂේත්‍රයෙන් ලබාගත් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් උපාධියක් ලබා තිබීම.

**වයස් සීමාව :**

අවුරුදු 22 ට නොඅඩු හා අවුරුදු 45 ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන්ට උපරිම වයස් සීමාව අදාළ නොවේ.

**වැටුප් ක්‍රමය :**

2016.04.25 දිනැති 02/2016 කළමනාකරණ සේවා චක්‍රලේඛයට අනුව 2020 සිට ඔබේ තනතුරට හිමි වැටුප් ප්‍රමාණය MA - 3 (2016) - රු. 32,200 - 10X445 - 11X660 - 10X730 - 5X750 - 54,960 ක් වේ.

බඳවා ගැනීමේ දී වැටුප් තලය රු. 28,880.00 වේ.

**වෙනත් දීමනා :** රජය මගින් අනුමත දීමනා හිමි වේ.

### සම්බන්ධීකරණ නිලධාරී තනතුරු - 14

**සුදුසුකම් :**

අලෙවිකරණය / කළමනාකරණය / වාණිජ්‍යය / ආර්ථික විද්‍යාව / සංඛ්‍යානය / සමාජ විද්‍යාව / සමාජ වැඩ / ප්‍රජා විද්‍යාව ඇතුළත් විෂය ක්ෂේත්‍රයකින් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් උපාධියක් ලබා තිබීම.

**වයස් සීමාව :**

අවුරුදු 22 ට නොඅඩු හා අවුරුදු 45 ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන්ට උපරිම වයස් සීමාව අදාළ නොවේ.

**වැටුප් ක්‍රමය :**

2016.04.25 දිනැති 02/2016 කළමනාකරණ සේවා චක්‍රලේඛයට අනුව 2020 සිට ඔබේ තනතුරට හිමි වැටුප් ප්‍රමාණය MA - 3 (2016) - රු. 32,200 - 10X445 - 11X660 - 10X730 - 5X750 - 54,960 ක් වේ.

බඳවා ගැනීමේ දී වැටුප් තලය රු. 28,880.00 වේ.

**වෙනත් දීමනා :** රජය මගින් අනුමත දීමනා හිමි වේ.

### විමර්ශන නිලධාරී තනතුර - 01

**සුදුසුකම් :**

වාණිජ්‍ය / ගිණුම්කරණය යන විෂය ක්ෂේත්‍රයන්ගෙන් ලබාගත් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් උපාධියක් ලබා තිබීම.

**වයස් සීමාව :**

අවුරුදු 22 ට නොඅඩු හා අවුරුදු 45 ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන්ට උපරිම වයස් සීමාව අදාළ නොවේ.

**වැටුප් ක්‍රමය :**

2016.04.25 දිනැති 02/2016 කළමනාකරණ සේවා චක්‍රලේඛයට අනුව 2020 සිට ඔබේ තනතුරට හිමි වැටුප් ප්‍රමාණය MA - 3 (2016) - රු. 32,200 - 10X445 - 11X660 - 10X730 - 5X750 - 54,960 ක් වේ.

බඳවා ගැනීමේ දී වැටුප් තලය රු. 28,880.00 වේ

**වෙනත් දීමනා :** රජය මගින් අනුමත දීමනා හිමි වේ.

### කළමනාකරණ සහකාර (තාක්ෂණික නොවන) තනතුරු - 05

**සුදුසුකම් :**

01. අ.පො.ස. සාමාන්‍ය පෙළ විභාගයෙන් සිංහල / දෙමළ හා ගණිතය ඇතුළු විෂයන් 04 කට සම්මාන සාමාර්ථයන් සහිතව විෂයන් 06 කින් එකවර සමත්ව තිබීම.
02. අ.පො.ස. උසස් පෙළ විභාගයෙන් අවම වශයෙන් විෂයන් 03 ක් (සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර) සමත්ව තිබීම.
03. පරිගණක වදන් සැකසුම / යතුරු ලියනය පිළිබඳ තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගන්නා පාඨමාලාවක් හදාරා තිබීම හෝ වෙනත් ඒ හා සමාන මට්ටමේ නිපුණතාවත් අතිරේක සුදුසුකම් වශයෙන් සලකනු ලැබේ.

**අභ්‍යන්තර අයදුම්කරුවන්**

(අ) ප්‍රාථමික ශ්‍රේණිය - ශිල්පීය නොවන, අර්ධ ශිල්පීය සහ ශිල්පීය සේවා ගණයන්හි පහත "ආ", "ඇ", "ඈ" සඳහන් සුදුසුකම් ඇති සේවකයින්ට මේ සඳහා අයදුම් කළ හැකිය.

(ආ) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේ දී,

i. සිංහල / දෙමළ
ii. ගණිතය

යන විෂයන් ඇතුළුව විෂයයන් හතරකට (04) කට සම්මාන සාමාර්ථයන් සහිතව එකවර විෂයන් හය (06) කින් සමත්ව තිබීම.

පරිගණක වදන් සැකසුම / යතුරු ලියනය පිළිබඳ තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගන්නා පාඨමාලාවක් හදාරා තිබීම හෝ වෙනත් ඒ හා සමාන මට්ටමේ නිපුණතාවත් අතිරේක සුදුසුකමක් වශයෙන් සලකනු ලැබේ.

(ඇ) සේවයෙහි ස්ථිර පත්වීම් දැරිය යුතු අතර, එම පත්වීම්වල ස්ථිර කරනු ලැබ සිටිය යුතුය.

(ඈ) නියමිත දිනට පූර්වාසන්නව ස්ථිර පත්වීමක යටත් පිරිසෙයින් අවුරුදු 05 ක අඛණ්ඩව සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කොට තිබිය යුතුය.

**වයස් සීමාව :**

අවුරුදු 18 ට නොඅඩු හා අවුරුදු 45 ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන්ට උපරිම වයස් සීමාව අදාළ නොවේ.

**වැටුප් ක්‍රමය :**

2016.04.25 දිනැති 02/2016 කළමනාකරණ සේවා චක්‍රලේඛයට අනුව 2020 සිට ඔබේ තනතුරට හිමි වැටුප් ප්‍රමාණය MA 1-1 (2016) - රු. 27,910 - 10X300 - 7X350 - 4X495 - 20X660 - 48,540.00 ක් වේ.

© THE ASSOCIATED NEWSPAPERS OF CEYLON LTD ALL RIGHTS RESERVED.

බඳවා ගැනීමේ දී වැටුප් තලය රු. 25,018.00 සමග රු. 1200.00 ක ගැළපුම් දීමනා වේ.

**වෙනත් දීමනා :** රජය මගින් අනුමත දීමනා හිමි වේ.

### කාර්යාල කාර්ය සහයක තනතුර

**සුදුසුකම් :**

අධ්‍යන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයට පෙනී සිටීම.

**වයස් සීමාව :** අවුරුදු 18 ට නොඅඩු හා අවුරුදු 45 ට නොවැඩි විය යුතුය.

**වැටුප් ක්‍රමය :**

2016.04.25 දිනැති 02/2016 කළමනාකරණ සේවා චක්‍රලේඛයට අනුව 2020 සිට ඔබේ තනතුරට හිමි වැටුප් ප්‍රමාණය PL 1 (2016) - රු. 24,750 - 10X250 - 10X270 - 7X300 - 15X330 - 37,000.00 ක් වේ.

බඳවා ගැනීමේ දී වැටුප් තලය රු. 22,186.00 සමග රු. 2,284.00 ක ගැළපුම් දීමනා වේ.

**වෙනත් දීමනා :** රජය මගින් අනුමත දීමනා හිමි වේ.

**පොදු කොන්දේසි :**

**සෑම ඉල්ලුම්කරුවෙකුම,**

- ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුයි.
- තනතුරට පැවරෙන කාර්යයන් මැනවින් ඉටු කිරීම සඳහා අවශ්‍ය වන කායික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුයි.
- විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතුයි.
- රාජ්‍ය භාෂා ප්‍රවීණතාවය සපුරාලීමට හැකියාව තිබිය යුතුයි.
- පරිගණක භාවිතය පිළිබඳ දැනුම හා ඒ පිළිබඳ වෘත්තීය අධ්‍යාපන සුදුසුකම් ලබා තිබිය යුතුයි.

මෙම තනතුරු ස්ථිරය. සේවක අර්ථ සාධක අරමුදලට හා සේවා නියුක්තිකයන්ගේ භාරකාර අරමුදලට දායක විය යුතුයි. වසර තුනක පරිවාස කාලයකින් පසු ස්ථිර කරනු ලැබේ. ලිඛිත තරග විභාගයක් හෝ සම්මුඛ පරීක්ෂණ ප්‍රතිඵල මත තනතුර සඳහා බඳවාගනු ලැබේ.

ඔබගේ අයදුම්පත්‍රය "සභාපති, ශ්‍රී ලංකා සමාජ ආරක්ෂණ මණ්ඩලය, අංක 18, රාජගිරිය පාර, රාජගිරිය" යන ලිපිනයට ලියාපදිංචි තැපැලෙන් එවීම හෝ ප්‍රධාන කාර්යාලයේ පාලන අංශය වෙත 2019.09.16 දිනට පෙර ගෙනවිත් භාරදීම කළ යුතුය. දැනටමත් රාජ්‍ය අංශයේ හෝ ව්‍යවස්ථාපිත ආයතනවල සේවය කරන අයදුම්කරුවන් ආයතන ප්‍රධානියා මගින් අයදුම් කළ යුතුයි. අයදුම්පත එවන ලිපි කවරයේ වම් ඉහළ කෙළවරෙහි අයදුම් කරනු ලබන තනතුර සඳහන් කළ යුතුයි.

**පී.එම්. දේවක වීරසිංහ,**
**සභාපති,**
**ශ්‍රී ලංකා සමාජ ආරක්ෂණ මණ්ඩලය,**
**"සමාජ ආරක්ෂණ පියස", අංක 18, රාජගිරිය පාර, රාජගිරිය.**

**2019.09.08**

Source: Silumina, Sunday Observer (2019.09.08)